# මහබේරිතැන්නේ බැටළු ගොවි පළ



කථාව :— ඩෙරික් ෂොක්මන්ගෙනි.    ඡායාරූප :—ටී. බී. මහින්දරත්නගෙනි.

මහනුවර සිට නැගෙනහිරට තෙල්දෙනිය පාරේ සැතපුම් අටක් ඔබ්බෙහි පිහිටි මහබේරි තැන්න වතුගොවිපලේ එහි කළමනාකාර හා පාලක තැනවූ ආනන්ද ද අල්විස් මහතා විසින් බැටළුවන් ඇතිකිරීමේ ගොවි ව්‍යාපාරයක් සාර්ථක ලෙස අරඹා ඇත.

එංගලන්තයෙන් හා ඕස්ට්‍රේලියාවෙන් මෙරටට ගෙන්වන ලද බැටළු වර්ගයන් යාපනයේ දේශීය බැටළුවන් සමග දෙමුහුන් කොට ඇත. මෙම දෙමුහුන් සතුන්ගේ දෙවෙනි පරම්පරාව මස් නිපදවීමෙහිලා විශිෂ්ඨත්වයක් දක්වති. යාපනයේ දේශීය බැටළුවෙකුගෙන් මස් රා. 12–15 දක්වා අඩු ප්‍රමාණයක් ගත හැකි නමුදු මෙම බැටළු වර්ගයේ පැටියෙකුගෙන් මස් රාත්තල් 28–30 දක්වා ප්‍රමාණයක් ලබාගත හැක.



4——එච් 17163 (63/9)



මෙම ඡායාරූපයෙන් මසක් වයසැති දෙමුහුන් බැටළු පැටවෙකු ඇගේ මව වූ යාපන වර්ගයේ අවුරුදු තුනක් වයසැති බැටළු දෙනෙක් සමග පෙනේ.



මහබේරිතැන්න වතු ගොවිපලේ තණ බිම්වල තණ උලා කන දෙමුහුන් බැටළු වර්ගයේ දෙවෙනි පරම්පරාවක්.



මහබේරිතැන්නේ බැටළුවන් ඇතිකරනු ලබන්නේ තණකොළ පමණක් ආහාර පිණිස දීමෙනි. අළුතෙන් සිටුවන ලද පොල් ඉඩම්වල බ්‍රැකේරියා වර්ගයේ තෘණ වගාකරනු ලැබේ. අක්කර සියයක පොල් ඉඩමක බැටළුවන් 200–400 දක්වා ප්‍රමාණයක් තණ කවනු ලැබේ. උන් ඉඩමේ තැනින් තැනට ක්‍රමවත්ව මාරුකිරීම සාමාන්‍ය සිරිතයි. එසේ මාරුකරනු ලබන්නේ බැටළුවන් විසින් පොලොවට තණ පඳුරු කාදමා තෘණබිම විනාශවී යෑම වැලැක්වීමටයි. එහෙත් බැටළුවන් විසින් ලපටි පොල්පැල කා දමනු නොලැබේ.

## පාඨකයින්ගේ දැනගැනීම සඳහායි

ගොවිකම් සඟරාවේ පළකිරීම සඳහා තෝරාගනු ලබන ලිපි වලට 1968 ජනවාරි මාසයේ පටන් පහත දක්වා ඇති අයුරින් ගෙවීම් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ජනප්‍රිය ලිපි :—මුද්‍රිත පිටුවකට රුපියල් | .. .. | 7.50 |
| කව් පන්ති :—කවි පන්තියකට රුපියල් | .. | 15.00 |
| පරිවර්තන කිරීම සඳහා ඉංග්‍රීසියෙන් සපයනලද විද්‍යාත්මක ලිපි මුද්‍රිත පිටුවකට රුපියල් | .. .. | 10.00 |
| සිංහලෙන් සපයන ලද විද්‍යාත්මක ලිපි මුද්‍රිත පිටුවකට රුපියල් | | 15.00 |